IMMIGRATION ADVISERS AUTHORITY

## නවසීලන්ත බලපත්‍රලාභී ආගමන උපදේශකවරුන්

# වෘත්තීය ප්‍රමිතීන්

නවසීලන්තයේ බලපත්‍රලාභී ආගමන උපදේශකයින් යනු ආගමන උපදේශක නිපුණතා ප්‍රමිතීන් සපුරා ඇති සහ වෘත්තීය හැසිරීම් නීති මාලාවක් අනුගමනය කරන දක්ෂ පුද්ගලයින්ය.

ඔබේ නවසීලන්ත ආගමන විගමන උපදේශකවරයා, ආගමන විගමන උපදේශක අධිකාරිය (අධිකාරිය) මගින් බලපත්‍ර ලබාගත් අයෙකු විය යුතුය, නැතහොත් බලපත්‍ර ලබාගැනීමේ අවශ්‍යතාවයෙන් ඉවත්කළ අයෙකු විය යුතුය. යම් පුද්ගලයෙකු සතුව බලපත්‍රයක් තිබේදැයි පරීක්ෂා කිරීමට හෝ බලපත්‍ර ලබාගැනීමට අවශ්‍ය නොවන කණ්ඩායම් පිළිබඳව දැන ගැනීමට, අධිකාරියේ වෙබ් අඩවිය වන www.iaa.govt.nz වෙත පිවිසෙන්න.

### බලපත්‍රලාභී ආගමන උපදේශකවරුන්ගේ චර්යාධර්ම සංග්‍රහය

- ඔවුන්ට බලපත්‍ර ඇති බවට සාක්ෂි ඔබට පෙන්වීම
- අවංක, වෘත්තීයමය, කැපවීමෙන් කටයුතු කරන සහ ගෞරවනීය වීම
- සුදුසු පරිදි සැලකිලිමත්ව සහ නියමිත කාලසීමාව තුළ කටයුතු කිරීම
- ඔබට අපක්ෂපාතී උපදෙස් ලබා දීම
- ඔවුන්ට ලැබීමට නියමිත කොමිස් මුදල් ඇතුළුව, යම් ආකාරයක බැඳියා ගැටුමක් පවතී නම් ඒ බව හෙළි කිරීම සහ ඔබ වෙනුවෙන් දිගටම කටයුතු කිරීම සඳහා ඔබේ අනුමැතිය ලබා ගැනීම
- කිසියම් කාර්යයක් ආරම්භ කිරීමට පෙර, සැපයීමට නියමිත සේවාවන් සහ අදාළ ගාස්තු ඇතුළත් ලිඛිත ගිවිසුමක් ඔබට අත්සන් කිරීම සඳහා ලබා දීම
- සාධාරණ සහ නියමිත ගාස්තු අය කිරීම
- අයකිරීම්වලට අදාළ විස්තර සහිත සම්පූර්ණ ඉන්වොයිස ඔබට ලබා දීම
- ඔබේ අයදුම්පත භාර දුන් බව ඔබට දැනුම් දීම සහ ඒ පිළිබඳව නිරන්තරයෙන් හා නියමිත වේලාවට යාවත්කාලීන තොරතුරු ලබා දීම
- ඔබේ පෞද්ගලික ලේඛන ආරක්ෂිතව තබා ගැනීම සහ ඒවා ඔබට ආරක්ෂිතව ආපසු ලබා දීම.

ඔබේ බලපත්‍රලාභී ආගමන උපදේශකවරයා සම්බන්ධයෙන් ගැටලුවක් ඇති වුවහොත්, එය ඔවුන් සමඟම විසඳ ගැනීමට උත්සාහ කළ යුතුය.

ඔබට සහාය අවශ්‍ය නම්, අදාළ අධිකාරිය හා සම්බන්ධ වන්න.

අධිකාරිය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම ඔබේ වීසා අයදුම්පතට බලපෑමක් ඇති නොකරයි.

### ආගමන උපදේශක අධිකාරිය විසින්:

- සුදුසුකම් ලත් පුද්ගලයින්ට පමණක් ආගමන විගමන උපදෙස් ලබා දීම සඳහා බලපත්‍ර ලබා දීම සහතික කරයි
- බලපත්‍රලාභී ආගමන විගමන උපදේශකයින්ගේ ප්‍රසිද්ධ කරන ලද ලේඛනයක් පවත්වාගෙන යයි
- බලපත්‍රලාභී උපදේශකයින් සඳහා නිපුණතා ප්‍රමිතීන් සහ චර්යාධර්ම සංග්‍රහයක් සකස් කර පවත්වාගෙන යයි
- බලපත්‍රයක් හෝ නිදහස් කිරීමක් නොමැතිව උපදෙස් ලබා දීම වැනි, 2007 ආගමන විගමන උපදේශක බලපත්‍ර පනත යටතේ වන වැරදි සම්බන්ධයෙන් විමර්ශන සිදු කිරීම සහ බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සිදු කරයි
- බලපත්‍රලාභී ආගමන උපදේශකයින් පිළිබඳ පැමිණිලි ලබාගැනීම සහ, සුදුසු නම්, පැමිණිල්ල විභාග කර සම්බාධක පැනවිය හැකි ආගමන උපදේශක පැමිණිලි සහ විනය විනිශ්චය සභාව වෙත යොමු කරයි.

අධිකාරියට ඔබේ වීසා අයදුම්පතට සහය විය නොහැකිය.

වැඩිදුර තොරතුරු සඳහා **www.iaa.govt.nz** වෙත යන්න සහ:

- බලපත්‍රලාභී ආගමන උපදේශකවරුන්ගේ චර්යාධර්ම සංග්‍රහය **www.iaa.govt.nz/for-advisers/code-of-conduct**

### අදාළ ආයතනයේ සම්බන්ධතා විස්තර.

| | |
|---|---|
| **info@iaa.govt.nz** | 0508 422 422 |
| **www.iaa.govt.nz** | +64 9 925 3838 |

**මෙය මත ක්ලික් කිරීමෙන්**

**www.iaa.govt.nz** පුද්ගලයෙකු බලපත්‍රලාභියෙකුදැයි පරීක්ෂා කරන්න

බලපත්‍රලාභී වෘත්තිකයා ආරක්ෂිත සංක්‍රමණිකයා

MINISTRY OF BUSINESS, INNOVATION & EMPLOYMENT
HĪKINA WHAKATUTUKI

New Zealand Government
Te Kāwanatanga o Aotearoa

IAA 2934 (MB14069) 09/26 SINHALESE